# Abstract No 92

## මහායාන බුදුදහම ථේරවාදී ආගමික පූජාක්‍රම කෙරෙහි කළ බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.


**එස්. යූ. විජේසිංහ**
suw.wijesinghe@gmail.com
ඉතිහාසය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
**ජී. ඩී. කුමාරි**
සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
gdkumari.gamage@gmail.com



බුදුන්වහන්සේගේ පරිනිර්වාණයත් සමඟ බෞද්ධයන් අතර නොයෙක් මතවාද ,මතිමතාන්තර ගොඩනැගිණ. එහි ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ නිකාය රාශියක් බිහි වූ අතර පැහැදිලි ලක්ෂණවලින් සමන්විත බෞද්ධනිකාය ද්විත්වයක් අනුක්‍රමයෙන් වැඩුණේ පළමුවන සියවසේ මුල්භාගයේ දී ය. ථේරවාද හා මහායාන යනුවෙන් ඒ අනුව ගමන් මාර්ග දෙකක් ඔස්සේ බුදුදහම විකාශනය විය. පැරණි සම්ප්‍රදායන් ඔස්සේ ථේරවාද බුදුදහම ගොඩනැගුණු අතර මහායාන සම්ප්‍රදාය වෙනස් ම වත්පිළිවෙත්, සංකල්පවලින් සමන්විත ව දියුණු විය. අශෝක සමයේ දී බුදුදහම විවිධ රටවලට සහ සම්බන්ධ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ලාංකේය ජනයාට ද නිමල බුදුදහමේ ස්වරූපය තත්වාකාරයෙන් ම ස්පර්ශයට මග පෑදීය. ඒ අනුව මෙරට ස්ථාපිත වූ ථේරවාදී සංකල්ප කෙරෙහි මහායාන ධර්මය බලපෑමක් සිදු කළේ ද, එහි බලපෑම කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණ යි. බෝධිසත්ව වන්දනය මහායාන දහමේ ප්‍රමුඛ සංකල්පයකි. පසුකාලීන ව මෙය විවිධ අන්දමේ වෙනස්කම්වලට භාජනය වෙමින් ථේරවාදී බුදුදහමට එකතු වූ ආකාරය දෘශ්‍යමාන සාධක වේ. එම තත්ත්වය සාමාන්‍ය ජනයාගේ සමාජය හා සහ සම්බන්ධ වී ඇති අතර වර්තමානය දක්වා ම එහි විවිධ ස්වරූප හඳුනා ගත හැකි ය. භික්ෂූන් වහන්සේලා විසින් සිදු කළයුතු වතාවත් මෙන් ම, බුදුදහමේ විවිධ පුදපූජා, උත්සව ආදිය ට මෙන් ම සාමාන්‍ය බෞද්ධාගමික ජනදිවිය පවා වෙනසකට බඳුන් වූ අවස්ථා නිරූපිත ය. මහායාන බුදුදහමේ ඇතැම් ලක්ෂණ ථේරවාද බුදුදහම ආශ්‍රිත සමාජ වටපිටාව අතික්‍රමණය කරමින් දෘශ්‍යමාන වන බව එහි දී පැහැදිලි ය. එහි බලපෑම පිළිබඳ අධ්‍යයනය මගින් ඒ බැව් තහවුරු කරන සාධක පවතින බවත් නිරීක්ෂණය වේ. මෙහි අධ්‍යයන ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියක මූලාශය යොදා ගනු ලැබේ.


**ප්‍රමුඛපද :** මහායාන, ථේරවාද, පුදපූජා, බුදුදහම